මල්ලියවඩු නලින් චමින්ද ප්‍රියදර්ශන

ප්‍රාදේශීය සභා මන්ත්‍රී,

ඇල්පිටිය ප්‍රාදේශීය සභාව,

ප්‍රසාදිනී, තල්ගස්පේ,

ඇල්පිටිය.

2025-04-28

අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසන් සභාව

මළලසේකර මාවත,

කොළඹ.

<u>ගරු අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසම වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලබන පැමිණිල්ලයි</u>

මෙහි පැමිණිලිකරු වන මා, ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණය සඳහා ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ නියෝජනය කරමින් තරඟ කර පත් වූ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් වන අතර එකී ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙසද කටයුතු කර ඇත.

එල්. එල්. සනත් ප්‍රියන්ත සුමනසිරි මහතා ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ වර්තමාන සභාපතිවරයා ලෙස කටයුතු කරන අතර ඩී.පී. අනුෂා සුජානි ප්‍රියදර්ශනී මහත්මිය එහි ලේකම්වරිය ලෙස කටයුතු කරයි.

2025 පෙබරවාරි 03 දින පැවැති ඇල්පිටිය CLEAN SRI LANKA ව්‍යාපෘතිය සඳහා ඇල්පිටිය ප්‍රාදේශීය සභාව එහි අරමුදල් වැය කර ඇති අතර එහි යන්ත්‍රෝපකරණ ඇතුළු සම්පත්ද, සේවකයන්ගේ ශ්‍රමය ද යොදාගෙන ඇත.

ඉහත 2025.02.03 දින වැඩසටහන වෙනුවෙන් ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ අරමුදල් යොදා ගැනීම වෙනුවෙන් ප්‍රාදේශීය සභාවේ මහා සභාව වෙත 2025.02.03 වන විට කිසිදු යෝජනාවක් ඉදිරිපත් කර නොතිබුණු අතර ඒ සඳහා සභා අනුමැතිය ද ලබාගෙන නොතිබුණි.

2017 අංක 22 සහ 2014 අංක 36 දරණ සංශෝධන සහිත 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත යටතට ඇල්පිටිය ප්‍රාදේශීය සභාව යටත් වේ. එකී පනත අනුවද ප්‍රාදේශීය සභාව මෙතෙක් අනුගමනය කළ සියලු රීති හා සම්ප්‍රදායන්ට අනුවද ප්‍රාදේශීය සභාව යම් වියදමක් දැරිය යුත්තේ හෝ ප්‍රාදේශීය සභා අරමුදලේ වියදම් වැය කළ යුත්තේ මහා සභාවේ අනුමැතිය මත පමණි.

ඉහත ප්‍රාදේශීය සභාවේ 132, 173, 174 සහ 175 වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාවකට වියදම් දැරිය යුතු ආකාරය සඳහන් වන අතර ඒසේ වියදම් දැරීමේදී ඒ සඳහා වියදම් දැරීමට පෙර ප්‍රාදේශීය සභාවේ මහ සභාවට

CamScanner